නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන මගින් කෘෂිකාර්මික යෙදවුම් භාවිතය සඳහා වන මාර්ගෝපදේශ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

දෙවන අනුවාදය, 2025 ජූලි 28

(1) පූර්ව අවශ්‍යතා

- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරුවන් විසින් නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන භාවිතය පිළිබඳව ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) විසින් නිකුත් කරන ලද නවතම මාර්ගෝපදේශ/රෙගුලාසි කියවා තේරුම් ගෙන අනුගමනය කළ යුතු ය (https://www.caa.lk/en/drones).
- ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) විසින් නිකුත් කරන ලද නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන මාර්ගෝපදේශ **ඇමුණුම** I හි දක්වා ඇත.

(2) විශේෂ සලකා බැලීම්

- නියමුවන් රහිත ගුවන් යානා (UAS) /ඩ්‍රෝන ක්‍රියාකරුවන් නිර්දේශිත පුද්ගල ආරක්ෂණ උපකරණ (PPEs) භාවිතා කරන බවට සහතික විය යුතු අතර නියමුවන් රහිත ගුවන් යානා (UAS) / ඩ්‍රෝන මගින් පළිබෝධනාශක ඉසින අතරතුර ඉලක්ක නොවන ස්ථාන/ද්‍රව්‍ය/දේපළ පළිබෝධනාශක මගින් දූෂණය වීමෙන් ආරක්ෂා කිරීමට හැකි සෑම පියවරක්ම ගත යුතු ය.
- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන ක්‍රියාකරුවන් විසින් එහි ක්‍රියාකාරිත්වය අතරතුර ඩ්‍රෝනයේ පිහිටීමෙන් තිරස් අක්ෂය මත සිට මිනිසුන් සහ ගෘහාශ්‍රිත සතුන් අවම වශයෙන් මීටර් 30ක් වත් අවම දුරින් තබා ගත යුතු ය.
- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන ක්‍රියාකරුවන් පළිබෝධනාශක ඉසීම සම්බන්ධයෙන් පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලය සහ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන භාවිතා කරන්නන් සඳහා වෙනත් ඕනෑම රජයේ බලධාරියකු විසින් පනවන ලද මාර්ගෝපදේශ සහ රෙගුලාසි අනුගමනය කරමින් ඒවාට අනුකූල විය යුතු ය.
- සේවා සපයන්නෙකු විසින් නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන මෙහෙයුම් සිදු කළ යුත්තේ ගොවින්ගේ /ගොවි සංවිධානයේ නිසි අනුමැතිය ඇතිව පමණි.
- සම්පූර්ණ වගා ක්ෂේත්‍රයටම යෙදුමට වඩා හැකි සෑම විටම ස්ථානීය පළිබෝධනාශක යෙදීම නිර්දේශ කෙරේ.
- සුළං වේගය 3 m/sec (11 km/h) වඩා අඩු වූ විට පමණක් වායව ඉසීම සිදු කළ යුතු ය.
- බෝග වියනට ඉහළින් පවත්වා ගත යුතු ඉසියේ උස බෝගය අනුව හා බෝගයේ වයස අනුව විය යුතු අතර ඉසින විටදී ආරක්ෂාව සඳහා නිර්දේශිත වේගයන් පමණක් භාවිතා කළ යුතු ය.
- ඉසීම අතරතුර නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන හි වේගය සහ උන්නතාංශයේ (උස්/පහත් කිරීම්) හදිසි වෙනස්කම් සිදු කිරීමෙන් වැළකී සිටිය යුතු ය.
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඉසින උස පිළිබඳ සාමාන්‍ය මාර්ගෝපදේශ **ඇමුණුම II** හි දක්වා ඇත.

(3) පියාසර කොන්දේසි

- පියාසර කිරීමට පෙර කාලගුණය සහ උෂ්ණත්වයේ වෙනස්කම් සලකා බලන්න - අධික වර්ෂාපතනය සහ සුළං සහිත දිනවලදී ඉසින මෙහෙයුම් සඳහා නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන භාවිතා නොකළ යුතු ය.
- පළිබෝධනාශක යෙදීමට පෙර එය භාවිතා කළ යුතු ප්‍රදේශ, භාවිතා කළ යුතු නිර්දේශිත පළිබෝධනාශක, යෙදිය යුතු මාත්‍රාව ආදිය නිවැරදිව හඳුනා ගෙන තිබිය යුතු ය.
- පළිබෝධනාශක ඉසීම සිදු නොකළ යුතු ප්‍රදේශ ඇතුලත්ව (පාරිසරික සංවේදී ප්‍රදේශ, නිවාස සහ උද්‍යාන, පාසල්, පොදු ප්‍රදේශ, රෝහල්, පොදු මාර්ග සහ පහසුකම්, පශු සම්පත්, ජල මූලාශ්‍ර, තෙත්බිම්) අදාළ ප්‍රදේශයේ නිවැරදි සිතියම් සකස් කළ යුතු ය.
- ඉසින ප්‍රදේශය අවම වශයෙන් අක්කර 1/2 ක් විය යුතු වේ.
- පළිබෝධනාශක ඉසීම සිදු කරන ප්‍රදේශයේ මී මැසි ජනපද නැති බව සහ යාබද ඉඩමේ මල් පිපෙන අවස්ථාවේ භෝග නැති බව තහවුරු කර ගත යුතු ය.
- රසායනික භාවිතය සීමා කර ඇති හෝ තහනම් කර ඇති ස්ථාන වලින් (කාබනික හෝ GAP ක්ෂේත්‍ර) අවම වශයෙන් මීටර් 30ක දුරක් තබා ගත යුතු ය.

(4) නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරුවන්ගේ ලියාපදිංචිය සහ සුදුසුකම්

- පළිබෝධනාශක යෙදීම සඳහා නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන වාණිජමය වශයෙන් භාවිතා කිරීම සඳහා නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරුවන්/ආයතන 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 26 වැනි වගන්තිය යටතේ නිකුත් කර ඇති නියෝග ප්‍රකාරව බලපත්‍ර ලබා ගත යුතු ය.
- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරුවන්ට අවම වශයෙන් NVQ IV මට්ටමේ ප්‍රවීනතා සහතිකයක් තිබිය යුතු ය.

(5) අදාළ රෙගුලාසි තේරුම් ගැනීම සහ අනුකූල වීම

- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරුවන් සහ පරිශීලකයින් විසින් පළිබෝධනාශක ඉසීම සඳහා නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා භාවිතයට අදාළ වන ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) විසින් පනවන ලද සියළුම රෙගුලාසි අවබෝධ කර ගත යුතු ය.

(a) ලේඛනගත කිරීම

- පරීක්ෂා කිරීම සඳහා ඕනෑම අධිකාරියකට පහසුවෙන් ප්‍රවේශ විය හැකිවන පරිදි යාවත්කාලීන ලේඛන පවත්වා ගත යුතු ය.
- අවශ්‍ය ලියකියවිලි (පහත සඳහන් දෑ ඇතුළුව, නමුත් ලැයිස්තුවට පමණක් සීමා නොවේ.)
  - ✓ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා ලියාපදිංචි බලපත්‍රය සහ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා සඳහා මෙහෙයුම් බලපත්‍රය;
  - ✓ අදාළ බෝග-පළිබෝධ සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් නිර්දේශ කරනු ලබන ලියාපදිංචි පළිබෝධනාශක ඇතුලත් ලේඛනය;

- ✓ වාණිජ පදනමින් පළිබෝධනාශක ඉසින කටයුතු සිදු කිරීම සඳහා පළිබෝධනාශක රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබා ගත් ලියාපදිංචිය;
- ✓ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරුවාගේ පුහුණු/සුදුසුකම් සහතිකය; සහ
- ✓ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරුවාගේ නම.

- ඉසින ක්‍රමාංකනය ඇතුළුව ඉසීම ක්‍රියාවලිය පිළිබඳ සියලු වාර්තා.
- අවශ්‍ය අවස්ථාවලදී ලබාගත් අවසරයන් සහ පියාසර සැලසුම්.
- බලධාරීන් විසින් ලබාදුන් අනුමැතීන්.

(b) නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා පියාසැරිය

- පෙර පියාසැරි පිරික්සුම් ලැයිස්තුව පවත්වා ගත යුතු ය.
- කාන්දුවීම් සහ හානි නැති බව තහවුරු කර ගැනීම සඳහා පරීක්ෂා කළ යුතු ය.
- ආරක්ෂාකාරී මෙහෙයුමක් සහතික කිරීම සඳහා දුරස්ථ පාලකය පරීක්ෂා කළ යුතු ය.
- ආරෝපිත බැටරි ප්‍රමාණවත් සංඛ්‍යාවක් සහ බැටරි ආරෝපණ උපකරණ ඇති බවට සහතික විය යුතු ය.
- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා ස්වයංක්‍රීයකරණයේ පවත්වා ගත යුතු ය.

(c) නියමුවන් රහිත ගුවන් යානා (UAS)/මෘදුකාංගය

- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා මෙහෙයුමේ සාර්ථකත්වය සඳහා නවතම මෘදුකාංග භාවිතා කිරීම සහ නිෂ්පාදකයාගේ උපදෙස් අනුගමනය කළ යුතු ය.
- සම්බන්ධතාවය, සංචලනය සහ හැසිරීම සඳහා කළ යුතු ක්‍රමාංකනය නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා ක්‍රියාත්මක කිරීමට පෙර සිදු කළ යුතු ය.
- පෙර පියාසැරි සැකසුම් පරීක්ෂා කළ යුතු ය.
  උදා: ජී.පී.එස්., සැටලයිට් තත්වයන්, පියාසැරි පාලන ආදිය.
- සෑමවිටම පැරණි මාදිලි නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා සඳහා Real Time Kinematic භාවිතා කළ යුතු ය. මෙය කාර්යයේ ගුණාත්මභාවයට හා නිරවද්‍යභාවයේ සැලකිය යුතු දියුණුවක් ඇති කරයි.

(d) නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානාව සකස් කිරීම - ඉසීමට පෙර

- ඉසීමට පෙර ඉසින ටැංකියේ කාන්දුවීම්, හානි, දෝෂ සහිත සම්බන්ධතා, හෝස් ආදිය පරීක්ෂා කළ යුතු ය.
- ඉසීමට පෙර ඉසින ටැංකියේ පිරිසිදු කරන්න. මෙම ක්‍රියාවලිය සඳහා නිෂ්පාදකයාගේ උපදෙස් අනුගමනය කළ යුතු ය.

(e) නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය කිරීම
(මුල් වරට භාවිතා කිරීමට පෙර සහ කන්නය තුල වරින් වර සිදු කිරීම වැදගත්ය.)

- කෘෂිකාර්මික මෙහෙයුම්වලදී ස්වයංක්‍රීය ඇතුළතින් ක්‍රියා කරන පොම්ප ක්‍රමාංකන පද්ධතියකින් (automatic internal-pump calibration system) යුතු UAS/ඩ්‍රෝන සඳහා ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.
- ඉහත 5(d) කොටසෙහි සඳහන් පරිදි ඉසින යන්ත්‍රය පරීක්ෂා කිරීමෙන් පසු නිෂ්පාදකයාගේ උපදෙස් අනුව ඉසින යන්ත්‍රය ක්‍රමාංකනය සිදු කළ යුතු ය.
- පළිබෝධනාශක (වල්නාශක, දිලීරනාශක, කෘමිනාශක) සඳහා කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හෝ නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා නිෂ්පාදකයා විසින් නිර්දේශිත නොසල් වර්ගය භාවිතා කළ යුතු ය. භාවිතයට පෙර නොසල නිසි ක්‍රියාකාරිත්වයෙහි ඇති බව තහවුරු කර ගත යුතු ය.
- යම්කිසි අසාමාන්‍යතාවක් හඳුනාගත හොත් නිෂ්පාදකයාගේ නිර්දේශ අනුව නිවැරදි කිරීම සිදු කළ යුතු ය.

(f) පළිබෝධනාශක සංයෝග

- පළිබෝධනාශක සංයෝග භාවිතය ට අදාලව නිෂ්පාදකයා විසින් ලබා දී ඇති මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු ය.
- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන මගින් ඉසීම සඳහා කුඩු (Dust), ජලයේ තෙත් කළ හැකි කුඩු (Powder) හෝ Smoke-generating ආකාරයේ සංයෝග භාවිතා නොකළ යුතු ය. ඉසිම කළ හැකි granule formulation සඳහා විසිරුම් ටැංකිය භාවිතා කළ යුතු ය.

(g) ඉලක්ක බෝග සහ පළිබෝධ සඳහා ඉසීම සිදු කිරීම
(කෘමි පළිබෝධ, රෝග කාරක සහ වල් පැලෑටි)

- කෘෂිකර්ම උපදේශක (Al) ගේ සහාය ඇතිව නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන මගින් පළිබෝධනාශක යෙදීමේ අවශ්‍යතාව ගොවි මහතා විසින් තහවුරු කර ගත යුතු ය.
- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන මගින් ඉසිම සිදු කිරීමට තීරණය වූ පසු පහත මාර්ගෝපදේශ අනුගමනය කළ යුතු ය.

    i. බෝගය නිවැරදි වර්ධන අවධියේ සහ නිවැරදි වියන් උසෙහි ඇති බව තහවුරු කර ගත යුතු ය. අස්වැන්නට හානි වීම වළක්වා ගැනීම සඳහා බෝගයේ මල් පිපෙන හා පරිණත අවස්ථාවන්හිදී අඩු උසකින් නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා පියාසර කිරීමේදී අවශ්‍ය පූර්වාරක්ෂාවන් අනුගමනය කළ යුතු ය.

    ii. කෘමි පළිබෝධ/රෝග/වල් පැලෑටි ඇති ස්ථානය නිවැරදිව හඳුනා ගත යුතු ය.

    iii. පළිබෝධනාශක භාවිතා කිරීම සම්බන්ධයෙන් අදාළ රජයේ දෙපාර්තමේන්තුව/ආයතනය විසින් සපයනු ලබන පළිබෝධනාශක භාවිතය පිළිබඳ නිර්දේශය නිවැරදිව අවබෝධ කරගත යුතු ය.

    iv. ඉලක්කගත පළිබෝධ/රෝග/වල් පැලෑටි පාලනය කිරීම සඳහා යොදා ගන්නා පළිබෝධනාශක ප්‍රමාණය නිර්දේශයේ සඳහන් පරිදි විය යුතු ය. කිසිදු අවස්ථාවකදී පාරිසරික පද්ධතියට හානි වන පරිදි පළිබෝධනාශක යොදන ප්‍රමාණය වැඩි කිරීම නොකළ යුතු ය.

v. නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා සමූහ වශයෙන් භාවිතා කිරීමෙන් වැළකිය යුතු ය. එකම ප්‍රදේශයක එකවරකට නියමුවන් රහිත ගුවන් යානාවකට (UAS)/ඩ්‍රෝන එක් යානාවකට වඩා භාවිතා නොකළ යුතු ය.

vi. බෝගයේ වියනේ සිට නිර්දේශිත උස පවත්වා ගත යුතු ය.

තිරස් අක්ෂය දිගේ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝනයේ වේගය සඳහා නිෂ්පාදකයාගේ නිර්දේශය අනුගමනය කළ යුතු ය (ඇමුණුම II).

vii. හයිඩ්‍රොලික නොසල් සවි කළ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන මඟින් ඉසීම බාර් 1.5–3 පීඩනයෙන් සිදු කළ යුතු ය.

(h) ඉසින යන්ත්‍රය - ඉසීමට පසු සහ හිස් පළිබෝධනාශක බහාලුම් බැහැර කිරීම

- ඉතිරි පළිබෝධනාශක සහ හිස් පළිබෝධනාශක බහාලුම් බැහැර කිරීම සහ ඉසින උපකරණ පිරිසිදු කිරීම පිළිබඳව 1980 අංක 33 දරණ පළිබෝධනාශක පාලන කිරීමේ පනතේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු ය.

(i) නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ ඩ්‍රෝන භාවිතයෙන් ඉසින මෙහෙයුම් අවසන් කිරීමෙන් පසු ලේඛනගත කිරීම

- ඉසීම සිදු කරන ලද ස්ථානයෙන් පිටවීමට පෙර සිදු කරන ලද දේ (භාවිතා කරන ලද නිෂ්පාදන සහ ප්‍රමාණය, බෝග, ඉලක්ක, ස්ථානය) භාවිතා කරන උපකරණ, සම්බන්ධ වූ පිරිස් සහ ඉසින වේලාව සහ දිනය පිළිබඳ වාර්තා සම්පූර්ණ කළ යුතු ය.
- ප්‍රමාණවත් භූමි දත්ත සමඟ පියාසැරි ලොග් සටහන් පවත්වා ගත යුතු ය.

(j) අනතුරු වාර්තා කිරීම

- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරු හෝ හිමිකරු පැය 2 ක් ඇතුළත, පුද්ගලික හෝ පොදු දේපළ විනාශ වීම සම්බන්ධව හෝ හදිසි අනතුරක් හෝ සිදුවීමක් සහ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා ඕනෑම මෙහෙයුමකින් තුන්වන පාර්ශ්වයට සිදුවන ඕනෑම තුවාලයක් CAASL ක්‍රියාත්මක කිරීමේ නිර්දේශවල 27 වන වගන්තියට අනුව එම ස්ථානයේ ළඟම ඇති පොලිස් ස්ථානයට වාර්තා කළ යුතු ය (ලේඛන අංකය: SLCAIS 053, නියමුවන් රහිත ගුවන් යානා මෙහෙයුම් සඳහා අවශ්‍යතා, CA-IS-2017-GEN-001 GEN-001).
- නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන ක්‍රියාකරු හෝ හිමිකරු භාවිතා කරන පළිබෝධනාශකවල ලේබල් මාර්ගෝපදේශයන්ට අනුව පළිබෝධනාශක කාන්දුවට අදාළ ඕනෑම අනතුරක් පැය 6 ක් ඇතුළත වාර්තා කළ යුතු ය.

සටහන :

භාවිතයේ කාර්යක්ෂමතාව සහ ආරක්ෂාව වැඩි දියුණු කිරීමේ අරමුණින් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් රැස් කරන ලද විද්‍යාත්මකව වලංගු තොරතුරු මත පදනම්ව ඉහත මාර්ගෝපදේශ වරින් වර වෙනස් වීමට යටත් වන බව කරුණාවෙන් සලකන්න. එසේම, මෙය 1994 අංක 06 සහ 2011 අංක 31 පනත් මඟින් සංශෝධිත 1980 අංක 33 දරණපළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ නීතිමය නියමයන්ට අනුකූලව සිදු කළ යුතු ය.

ඇමුණුම I

සාමාන්‍යය නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා සඳහා මාර්ගෝපදේශ

ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය

2021 සැප්තැම්බර් 09

1. නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා පහත පරිදි බර පන්තිවලට වෙන් කරනු ලබන අතර මෙම සියලු නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා ශ්‍රී ලංකා සිවිල් ගුවන් සේවා අධිකාරිය (CAASL) යටතේ ලියාපදිංචි විය යුතු ය.

- A පන්තිය: බර ≥ 25 කිලෝග්‍රෑම්
- B පන්තිය: බර > 1 කිලෝග්‍රෑම් සහ < 25 කිලෝග්‍රෑම්
- C පන්තිය: බර > 200 ග්‍රෑම් සහ ≤ 1 කිලෝග්‍රෑම්

2. සම්පූර්ණ කරන ලද CAA/AU/015 පෝරමය drone@caa.lk වෙත යැවීමෙන් UAS/ඩ්‍රෝන යානා ලියාපදිංචි කළ හැකි ය.

3. කිසිදු දත්ත ග්‍රහණය කිරීමේ උපකරණයක් සවි කර නොමැති සහ ග්‍රෑම් 200 ට අඩු බරැති UAS/ඩ්‍රෝන යානා CAASL වෙත ලියාපදිංචි වීමට අවශ්‍ය නොවේ.

4. නියමුවන් රහිත ගුවන් යානාවක් (UAS)/ඩ්‍රෝන යානාවක් අනුමැතියකින් තොරව භාවිතා කළ හැක්කේ මිනිසුන් රහිත ගුවන් යානාවක් (UAS)/ඩ්‍රෝන යානාවක්;

- බර ග්‍රෑම් 200 ට අඩු;
- කිසිදු දත්ත ග්‍රහණය කිරීමේ උපාංගයක් සමඟ සවි කර නොමැති (උදා :කැමරාව);
- තමන්ගේම පරිශ්‍රයක හෝ දේපල හිමිකරුගේ කැමැත්ත ඇතිව ක්‍රියාත්මක වන විට; හෝ
- බිම් මට්ටමේ සිට අඩි 150 ට අඩුවෙන් ක්‍රියාත්මක වන විට පමණි.

5. අනෙකුත් සියලුම අවස්ථාවන්හිදී අරමුණ කුමක් වුවත් CAASL අනුමැතිය ලබා ගත යුතු ය.

- ආරක්ෂාවට තර්ජනයක් විය හැකි දත්ත ග්‍රහණය කිරීමේ සංවේදක සහිත (උදා: කැමරාව) නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානයක් පියාසර කිරීමට (බර පන්ති කාණ්ඩය කුමක් වුවත්) ලිඛිත අනුමැතිය ලබා ගැනීමට ක්‍රියාකරු අපොහොසත් වුවහොත් ප්‍රාදේශීය පොලිසිය මඟින් පූර්ව අවසරය ලබා ගත යුතු ය.
- ක්‍රියාකරු එම කලාපයේ airpo11 වෙතින් ලිඛිත අනුමැතිය ලබා ගෙන ඇත්තේ නම් හෝ නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානා CAASL බලයලත් පුද්ගලයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක කරයි නම් ප්‍රාදේශීය පොලීසියේ පූර්ව අවසරය අවශ්‍ය නොවේ.

6. CAASL විසින් ගොඩනැගිල්ල තුළ පියාසර කිරීම ඇතුළුව පියාසර අනුමැතිය නිකුත් කරනු ලැබේ. නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානය නීත්‍යානුකූලව පියාසර කිරීමට CAASL වෙතින් ගුවන් අවකාශයේ අනුමැතිය ලබා ගත යුතු ය.

7. ආරක්ෂක අධිකාරීය මඟින් එකඟ වූ ක්‍රමවේදය අනුව අවසරය ලබා ගැනීම මූලික අවශ්‍යතාවයකි. වැඩි විස්තර සඳහා ආරක්ෂක හමුදා මූලස්ථානය (Office of Chief of Defense Staff - OCDS) හා සම්බන්ධ වන්න (OCDS සම්බන්ධතා විස්තර - දුරකථන :+94 11 2674503; +94 11 2674506, විද්‍යුත් තැපැල් - ocds.drone@gmail.com).

8. නියමුවන් රහිත ගුවන් යානා (UAS)/ඩ්‍රෝන යානයක් පියාසර කරන නව ස්ථාන සඳහා නැවත අනුමැතිය සඳහා අයදුම් කළ යුතු ය.

9. පියාසර කිරීමේ උපරිම උස බිම් මට්ටමේ සිට අඩි 150 ක් දක්වා වේ.

10. නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානයක් පියාසර කිරීමේ අරමුණ අනුව විශේෂ කොන්දේසි සහිතව බිම් මට්ටමේ සිට අඩි 150 ට වැඩි උසක් පියාසර කිරීමට විශේෂ අවසරයක් අවශ්‍ය වේ.

11. නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානයක් පියාසර කිරීම සඳහා තෙවන පාර්ශවීය වගකීම් රක්ෂණයක් අවශ්‍ය වේ.

12. නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානයක් ඕනෑම වේලාවක පියාසර කළ හැකි අතර අනුමැතිය සඳහා අයදුම් කිරීමේදී ක්‍රියාත්මක කාල සීමාව සඳහන් කළ යුතු ය.

13. ගුවන් තොටුපළේ වගකිව යුතු අධිකාරියකගේ කැමැත්ත/එකඟතාවය ඇතිව ඩ්‍රෝන යානයක් ගුවන් තොටුපළකට සමීපව පියාසර කළ හැකි අතර ගුවන් අවකාශයේ අනුමැතිය ලබා ගැනීම සඳහා CAASL වෙත අයදුම් කළ යුතු ය.

14. සාමාන්‍යයෙන් උස් බිමක, ගොඩනැඟිල්ලක හෝ වෙනත් ආධාරකයක සිට නියමුවන් රහිත ගුවන් යානාවක් UAS/ඩ්‍රෝන යානවක් පියාසර කිරීම සඳහා අවසර ලබා නොදේ. නමුත් මෙය විශේෂ කොන්දේසි සහිතව විශේෂ අවසරයකින් සිදු කළ හැකිය.

15. සාමාන්‍ය නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යාන මෙහෙයුම් ගමන් කරන වාහනවල හෝ චලනය වන වේදිකාවල සිදු කිරීම අනුමත නොකෙරේ. එහෙත්, විශේෂ අවසරයක් සහ විශේෂ කොන්දේසි සහිතව මෙවැනි මෙහෙයුම් සිදු කළ හැකිය.

සටහන : ඉහත රෙගුලාසිවල නවතම සංශෝධන සඳහා කරුණාකර CAASL වෙබ් අඩවිය පිරික්සන්න.

ඇමුණුම II

වී සහ බඩඉරිඟු වගාවල නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන මගින් කෘෂි යෙදවුම් යෙදීම සඳහා පොදු මාර්ගෝපදේශ

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

2025 ජූලි 28

1. පළිබෝධනාශක යෙදීමට නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

1.1. වී වගාව සඳහා පළිබෝධනාශක යෙදීමට නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

- නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානය ස්වයංක්‍රීය තත්ත්වයෙන් පවත්වා ගත යුතු ය.
- වී වගාවන් සඳහා නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා මගින් දිලීරනාශක යෙදීම නිර්දේශ නොකරයි.
- මල් පිපෙන අවධියේදී නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා මගින් පළිබෝධනාශක යෙදීම නිර්දේශ නොකරයි.
- පළිබෝධනාශක යෙදීමේදී මධ්‍යස්ථ පියාසර වේගයක් පවත්වා ගත යුතු ය (11-18 km/hr). අධික වේගය පළිබෝධනාශක යොදන ප්‍රදේශ මග හැරීමට හේතු වන අතර මඳ වේගය කාලය අපතේ යාමට මෙන් ම අධික පළිබෝධනාශක යෙදීමට හේතු වේ.
- ප්‍රවාහ අනුපාතය: මිනිත්තුවට ලීටර් 2–3 ක් ලෙස ස්ථිර ප්‍රවාහ අනුපාතයක් පවත්වා ගැනීම මගින් ප්‍රමාණවත් යෙදුමක් සහ අධිකව යෙදීම පාලනය කර ගත යුතු ය.
- මාර්ග පරතරය-සමාන්තර මාර්ග අතර දුර මීටර් 3 ක් වන ලෙස පවත්වා ගත යුතු ය. එහි සුළු අතිපිහිතවීම් නිසා තීරු මග හැරීමට හෝ අධික ලෙස පළිබෝධනාශක ඉසීමට හේතු නොවේ.
- නියරේ සිට මීටර් 1 ක දුරක් තබා ගත යුතු ය.
- බෝග වර්ධන අදියර අනුව පියාසර උස පවත්වා ගත යුතු ය (ප්ලාවිතය/විසිරීම අඩු කිරීමට, ඒකාකාරී යෙදීමට සහ විනිවිද යාම වැඩි කිරීමට සාපේක්ෂව අඩු උසින් පියාසර කළ යුතුය).
- නොසල අවහිර වීම වැළැක්වීමට සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සඳහා පළිබෝධනාශක මිශ්‍ර/දිය කිරීමට පිරිසිදු ජලය භාවිතා කළ යුතු ය.
- ඉසින ප්‍රදේශය මිනිසුන්ගෙන්/සතුන්ගෙන්/GAP/කාබනික ක්ෂේත්‍රවලින් අවම වශයෙන් මීටර් 30ක් දුරින් සහ ජල ප්‍රභවයන්ගෙන් මීටර් 100ක් දුරින් තිබිය යුතු ය.
- ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් ආවරණය කර ගැනීම සඳහා (පළිබෝධනාශක ඉසීම සඳහා) “route and boundary” පියාසර ක්‍රමය භාවිතා කර යෙදීම සිදු කළ යුතු ය.
- යාබද ක්ෂේත්‍රවලට ඉසිම වැළැක්වීම සඳහා මීටර් 1 ක ස්වාරක්ෂක (buffer) කලාපයක් පවත්වා ගත යුතු ය.
- යාබද ක්ෂේත්‍රවල ක්‍රියාකාරී පරාගකාරකයින් (උදා: මී මැසි ජනපද) නොමැති බව තහවුරු කර ගත යුතු ය.

1.1.1. වී වගාවන් සඳහා කෘමිනාශක යෙදීමට නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

මල් විවෘත වන කාලය (සාමාන්‍යයෙන් දින 7–10) තුල නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා මඟින් කෘමිනාශක යෙදීමෙන් වැළකිය යුතු ය.

මුල් බෝග වගා අවධිය

- පැළ අවධියේදී පියාසර උස මීටර් 1.5ක් හා වර්ධක අවධියේදී පියාසර උස මීටර 2.5 ක් පවත්වා ගත යුතු ය.
- වේගය පැයට කිලෝමීටර 11-18 ත් අතර පවත්වා ගත යුතු ය. 150-200 µm ප්‍රමාණයේ නොසල භාවිතා කළ යුතු ය.
- හෙක්ටයාරක් සඳහා ජලය ලීටර් 20ක පරිමාවක් භාවිතා කළ යුතු ය.
- ප්‍රවාහ අනුපාතය මිනිත්තුවට ලීටර 2-3 අතර පවත්වා ගත යුතු ය.
- සුළගේ වේගය තත්පරයට මීටර් 3 හෝ පැයට කිලෝමීටර් 11 වඩා අඩු විට ඉසීම සිදු කළ යුතු ය.

වර්ධක බෝග වගා අවධිය

- උස අඩු වී ප්‍රභේද සඳහා පියාසර උස මීටර 2.5-3 පමණ පවත්වා ගත යුතු ය.
- ඇද වැටීමට පාත්‍ර වී ප්‍රභේද/පාරම්පරික වී සඳහා පියාසර උස මීටර 3-3.5 පමණ පවත්වා ගත යුතු ය.
- වේගය පැයට කිලෝමීටර 11-18 ත් අතර පවත්වා ගත යුතු ය.
- 150-200 µm ප්‍රමාණයේ නොසල භාවිතා කළ යුතු ය.
- හෙක්ටයාරක් සඳහා ජලය ලීටර් 20ක පරිමාවක් භාවිතා කළ යුතු ය.
- ප්‍රවාහ අනුපාතය මිනිත්තුවට ලීටර 2-3 අතර පවත්වා ගත යුතු ය.
- සුළගේ වේගය තත්පරයට මීටර් 3 හෝ පැයට කිලෝමීටර් 11 වඩා අඩු විට ඉසීම සිදු කළ යුතු ය.

1.1.2. වී වගාවන් සඳහා වල්නාශක යෙදීමට නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

- පියාසර උස මුල් බෝග වගා අවධියේදී මීටර් 1.5ක් ලෙසත් වර්ධක බෝග වගා අවධියේදී මීටර 2.5-3ක් ලෙසත් පවත්වා ගත යුතු ය.
- 400-500 µm ප්‍රමාණයේ නොසල භාවිතා කළ යුතු ය.
- සුළගේ වේගය තත්පරයට මීටර් 3 හෝ පැයට කිලෝමීටර් 11 වඩා අඩු විට ඉසීම සිදු කළ යුතු ය.

1.2. බඩඉරිඟු වගාවන් සඳහා පළිබෝධනාශක යෙදීමට නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

- නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ස්වයංක්‍රීය තත්ත්වයෙන් පවත්වා ගත යුතු ය.
- සුළඟේ වේගය තත්පරයට මීටර් 3 හෝ පැයට කිලෝමීටර් 11 වඩා අඩු විට ඉසීම සිදු කළ යුතු ය.
- මල් පිපෙන අවධියේදී මිනිසුන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා මඟින් පළිබෝධනාශක යෙදීම නිර්දේශ නොකළ යුතු ය.
- පළිබෝධනාශක ඉසින ප්‍රදේශය මිනිසුන්ගෙන්/සතුන්ගෙන්/GAP/කාබනික ක්ෂේත්‍රවලින් අවම වශයෙන් මීටර් 30ක් දුරින් සහ ජල ප්‍රභවයන්ගෙන් මීටර් 100ක් දුරින් තිබිය යුතු ය.
- යාබද ක්ෂේත්‍රවල ක්‍රියාකාරී පරාගකාරකයින් (උදා: මී මැසි ජනපද) නොමැති බව තහවුරු කර ගත යුතු ය.

1.2.1. බඩඉරිඟු වගාවේ කෘමිනාශක ඉසීම සඳහා නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

බෝග -කුඩා වියන් අවධිය (සති 3-5 වගාවක්/ බඩඉරිඟු කොළ 5-7 සහිත අවස්ථාව)

- පියාසර උස මීටර් 2.5 ක් පවත්වා ගත යුතු ය.
- ප්‍රවාහ අනුපාතය මිනිත්තුවට ලීටර 2.5ක් පවත්වා ගත යුතු ය.
- 140 µm ප්‍රමාණයේ නොසල භාවිතා කළ යුතු ය.
- හෙක්ටයාරක වගා වපසරියක් සඳහා ජලය ලීටර් 20ක පරිමාවක් භාවිතා කළ යුතු ය.

බෝග -මධ්‍යම වියන් අවධිය (සති 8-9 වගාවක්/ බඩ ඉරිඟු කොළ 15-18 සහිත අවස්ථාව)

- පියාසර උස මීටර් 2.5 ක පවත්වා ගත යුතු ය.
- ප්‍රවාහ අනුපාතය මිනිත්තුවට ලීටර 2.5 ක් පවත්වා ගත යුතු ය.
- 140 µm ප්‍රමාණයේ නොසල භාවිතා කළ යුතු ය.
- හෙක්ටයාරක වගා වපසරියක් සඳහා ජලය ලීටර් 40ක පරිමාවක් භාවිතා කළ යුතු ය.

1.2.2. බඩඉරිඟු වගාවේ වල්නාශක ඉසීම සඳහා නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

බෝග -කුඩා වියන් අවධිය (පළමු සති 2)- පශ්චාත් නිර්ගමන වල්නාශක

- පියාසර උස මීටර් 2.5 ක පවත්වා ගත යුතු ය.
- ප්‍රවාහ අනුපාතය මිනිත්තුවට ලීටර 2.5 අතර පවත්වා ගත යුතු ය.
- 320-500 µm ප්‍රමාණයේ නොසල භාවිතා කළ යුතු ය.
- හෙක්ටයාරක වගා වපසරියක් සඳහා ජලය ලීටර් 20 - 30ක පරිමාවක් භාවිතා කළ යුතු ය.

2. බීජ වී යෙදීම සඳහා නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානා ක්‍රමාංකනය

- නියමුවන් රහිත ගුවන් යානා UAS/ඩ්‍රෝන යානය ස්වයංක්‍රීය තත්ත්වයෙන් පවත්වා ගත යුතු ය.
- මිනිසුන්/සතුන්ගෙන් අවම දුර මීටර් 30 ක් දුරින් පවත්වා ගත යුතු ය.

- යාබද ක්ෂේත්‍රවලට ඉසීම වැළැක්වීම සඳහා මීටර් 1 ක ස්වාරක්ෂක (buffer) කලාපයක් පවත්වා ගත යුතු ය.
- සුළගේ වේගය තත්පරයට මීටර් 3 හෝ පැයට කිලෝමීටර් 11 වඩා අඩු විට ඉසීම සිදු කළ යුතු ය.
- පියාසර උස මීටර 2-2.5 ක පවත්වා ගත යුතු ය.
- අවශ්‍ය අවම ප්‍රරෝහණය කරන ලද බීජ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 11 කි.
- බීජ විසිරුම් විවරය විවෘත වීමේ ප්‍රමාණය (Hopper opening) 47% කි.
- වේගය පැයට කිලෝමීටර 16 ක පවත්වා ගත යුතු ය.
- ඇස්තමේන්තුගත බීජ යෙදීම් අනුපාතය හෙක්ටයාරයට කිලෝ ග්‍රෑම් 100 කි.